# සියක් වස් සපුරණ මහා නායක හිමි

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක ගෞරවාර්හ වේවැල්දෙනියේ මේධාලංකාර මහා නාහිමියන් වහන්සේට සියක් වස් සපිරීම නිමිතිකොට පූජෝපහාර උත්සවයක් එංගලන්තයේ බර්මිංහැම් හි ජේතවන බෞද්ධ විහාරස්ථානයේ දී එම විහාරාධිපති පූජ්‍ය කැප්පිටියාගොඩ ගුණවංශ නිහිමියන්ගේ අනුශාසනය පරිදි සුනිල් කුකුලාවල සහ රසිකා කුමාරි යුවල ඇතුළු එම විහාර ස්ථානයේ දායක මඩුල්ල විසින් මෙම දෙසැම්බර් මස 6 හා 7 දෙ දින තුළ පවත්වනු ලැබී ය.

පැරණි පොත්පත්වල සඳහන් පරිදි ශ්‍රීලංකා රාමඤ්ඤ මහා නිකායේ ඉතිහාසය ශ්‍රී බුද්ධ වර්ෂ 1600 දක්වා ඈතට දිවෙයි. රාමඤ්ඤ රටෙහි විනයධර භික්ෂූන් වහන්සේලා දහසය නමක් විසින් ශ්‍රීලංකාවට ගෙන එනු ලැබූ මහණ උපසම්පදා වෙන් ඇරඹුණු මෙම නිකායෙහි ඉන්ද්‍රාසභවර ඤාණසාමි මහතෙරුන් මුල්තන්හි තබා බුද්ධ වර්ෂ 2007 ඇසළ මස ගාල්ලේ මහමෝදර උදකුක්ඛේප සීමාවේ දී ප්‍රථම උපසම්පදා මංගල්‍යය සිදුවිය. ඉන් ඇරඹුනු ශ්‍රීලංකා රාමඤ්ඤ මහා නිකායේ 1861 සිට 1935 දක්වා භික්ෂූන් වහන්සේලා එකොළොස් නමක් මහානායක ධුරයට පත්වී ඇති අතර, පූජ්‍ය පොත්තේවෙල පඤ්ඤාසාර මහනා හිමියන්ගේ අපවත්වීමෙන් පසු ඒ තනතුරට පත්වීමේ භාග්‍යය ලැබූයේ අපගේ ගෞරවාර්හ වේවැල්දෙණියේ මේධාලංකාර මහනායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ය.

1909 දී ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ මීරිගම හා නිට්ටඹුව වරකාපොළ නගර මැදිකොටගත් වේවැල්දෙනිය නම් සුන්දර ගමේ ප්‍රභූ පවුලකට දාව උන්වහන්සේ උපත ලැබූහ. 1923 මැයි මස 02 වෙනි දින මේ කුලකුමරුවා වේවැල්දෙනියේ මේධාලංකාර නමින් පැවිදි භූමියට ඇතුළත්වීය. නිට්ටඹුවේ විද්‍යානන්ද පිරිවෙණෙහි මූලික ධර්ම ශාස්ත්‍ර ඥාණය ලැබූ අතර සියලු ගුණාංග සපුරමින් නිසි ධර්ම ශාස්ත්‍රය වර්ධනය කළ උන්වහන්සේ විවිධ තනතුරු හෙබවූහ. සාසනවර්ධන පිරිවෙනෙහි පරිවෙනාධි පති ධූරයට පත්වූ උන්වහන්සේ අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨයෙහි පරිපාලන සභාවෙහි සභිකයෙකු ලෙස ද පත්වූහ. පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ කුලපති තනතුරත්, බුද්ධශ්‍රාවක ධර්ම පීඨයේ මහෝපාධ්‍යාය තනතුරත්, ශ්‍රී ලංකා ජන රජයේ උත්තරීතර අනුශාසක සභාවේ සභික ධූරයත් මේධාලංකාර හිමියන් වෙත පුදනු ලැබූවේ උන්වහන්සේ ආගමික ශාසනික සේවාව හා ජාතික මෙහෙයුම කෙරෙහි දැක්වූ නායකත්ව ගුණාංගයන් නිසාය.

සම්බුද්ධ ශාසනයේ දියුණුව උදෙසා කටයුතු කළ බැවින්ද, ධර්ම විනයට අනුරූපව සිය නිකළැල් දිවිපෙවෙත අන්‍යයන් උදෙසාම ගෙවූ බැවින් ද බොහෝ ගෞරව සම්මානයන් මේධාලංකාර නාහිමියන් වෙත ගලා ආවේය. ඒ අතර සාසන සොභන ශ්‍රී සද්ධර්මවාගීශ්වරාචාර්‍ය සිරිසරණංකරොපසෙන මහාවංසාවතංස සාහිත්‍ය චක්‍රවර්ති ත්‍රිපිටක විශාරද ගෞරව නාමයන්ද, ලෝක ශාස නය වෙනුවෙන් කළ අමිළ මෙහෙවර උදෙසා 2001 බුරුම දේශයෙන් අග්ගමහා සද්ධම්ම ජොතිකධජ ගෞරව නාමයෙන් ද උන්වහන්සේ පිදුම් ලැබූහ.

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ ප්‍රාදේශීය සංඝ සභාවේ ලේකම්, කාරක සභික, අනුවිජ්ජක, සඤ්ඤාලේඛකාධිකාරි හා අධිකරණ සංඝ නායක ආදී මෙසේ අනු පිළිවෙළින් සසුන් කෙත අත්දැකීම් බහුල මහා තෙරනමක් දක්වා සිය ජීවිතය එක් අරමුණක මෙහෙයවූ උන්වහන්සේ ඊට නිසි ගරු තනතුරෙන්ද පිදුම් ලබමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ



ශ්‍රීලංකා රාමඤ්ඤ නිකායේ මහා නා හිමියන් වන පූජ්‍ය වේවැල්දෙනියේ මේධාලංකාර ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ

මහා නිකායේ මහා නායක තනතුරට පත්වූහ.

සමාජයේ යහපත උදෙසා කටයුතු කළ උන්වහන්සේ විවිධ ආයතන බිහිකිරීමෙහිලා පුරෝගාමී වූහ. එකී සේ-වාවන් අතර, මීරිගම සාසනවර්ධන ළමා නිවාසය, සාසනවර්ධන පිරිවෙන, සාසනවර්ධන පෙරපාසල, සාසනවර්ධන දහම්පාසල, අපේ ළමයි දෘශ්‍යාබාධිත පාසල, වේවැල්දෙනිය මහා විද්‍යාලය, මීරිගම ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, සෙත්සෙවන වැඩිහිටි නිවාසය ද නම් කළ හැකිය.

1947 ඉතා දුෂ්කර නගරයක් වූ පොලොන්නරුවේ හිටපු මහ දිසාපති මධුරසිංහ මහාතාගේ ආරාධනයෙන් පොලොන්නරුව 316 හි ශ්‍රී දක්ෂිනාරාමය ගොඩ නැංවූයේද උන්වහන්සේය. එසේම නුවරඑළියේ, සීතා එළියේ විහාරයද ගැටළු මතුවූ කල්හි ඉතා අපහසු තත්වයන් යටතේ එවකට අගමැතිනි සිරිමා බන්ඩාර නායක මැතිණියගේ ද සහාය ඇතිව පිහිටුවනු ලද්දේය. මීට අමතරව දිවයිනේ තවත් බොහෝ වෙහෙර විහාරස්ථාන 20 කට අධික ප්‍රමාණයක් උන්වහන්සේ විසින් ආරම්භ කරනු ලැබ සසුනට පූජාකර ඇත.

දුලලභංච මනසුස්ස සතතං..... යන බුද්ධ පාඨය අනුව සැබවින්ම මනුෂ්‍ය ආත්ම භාවය ඉතා දුර්ලභ සම්පතකි. එය මානව වර්ගයාගේ මෙලොව පරලොව යහපත උදෙසා කැපකළ අය සිටින්නේ අල්ප වශයෙනි. මෙවැනි උතුමන්ගේ ගුණ ඒ ජීවත්වන කාලය තුළ ජනතා ප්‍රශංසාවට ලක්කිරීම කළ යුතුම දෙයකි.


පූජ්‍ය වේවැල්දෙණියේ මේධාලංකාර ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක ස්වාමිපාදයාණන් වහන් සේට නිදුක් නිරෝගී චිරජීවනය ප්‍රාර්ථනා කරමු.

**එක්සත් රාජධානියේ බර්මින්හැම් විහාරවාසී**
♦ ***පූජ්‍ය ශාස්ත්‍රාචාර්‍ය මායින්නොලුවේ පියනන්ද ස්වාමීන් වහන්සේ***

# සසුන දැය එළියකර බැස ගිය සුපුන් සඳ

“ අතීතයේ ජාතියත් රටත් රකින්න, ශාසනේ රකින්න, ඉදිරිපත්වෙලා වැඩකරපු භික්ෂූන් වහන්සේලා හිටියා. සමහර වෙලාවට යම් යම් ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. මං මේ ආත්මෙ නිවන් දකින්න අදහසක් නෑ. මං හිතනවා, මං එතෙන්ට ගිහිල්ලා මේ රටත් ජාතියත් ජාතික සමගියත් ඇතිකරලා, සම්බුද්ධ සාසනේ ආරක්ෂා කරගෙන මේ කට යුත්ත කළොත් මට නිවන් දකින්නට හොඳ පිංකමක් වෙයි ඒක. කුසල කර්මයක් වෙයි. මම ඒ අරමුණින් වැඩකරනවා.”
- පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි
2002 ජනවිජය සංවත්සරයේ දී

ඉහතක් වදන් සියළු ශ්‍රීලාංකික භික්ෂූන් වහන්සේලා ආදර්ශයට ගනිත්වා !



**පූජ්‍ය ගංගොඩවිල**
**සෝම ස්වාමින්වහන්සේ**

**මෑත** යුගයේ අප අතර පහළවූ දේශය එකළු කළ පැවිදි මිණිපහන පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන් අපවත්ව මේ **2008** දෙසැම්බර් මාසයට වසර **5** ක් සම්පූර්ණ වේ. සෝම හාමුදුරුවෝ දුශ්කර ගම් නියම්ගම් වලට පමණක් නොව සිංහලයින් වසන දේශ දේශාන්තරවලටද ගොස් යහපත් දැහැමි ශිෂ්ට සම්පන්න ජීවිතයක අගය ඔවුනට කියාදුන්හ. අප රට දැය සමය ඉතිහාසයේ පෙර නොවූවිරූ අභාග්‍ය සම්පන්න කාල පරිච්ඡේදයකට වැටී තිබෙන අද දවසේ උන්වහන්සේ ජීවමානව අප අතර හිඳීමේ අවශ්‍යතාව අප කාටත් දැඩිව දැනේ. අනේ ! උන්වහන්සේ සිටියා නම් යයි අපට නිතර සිතේ.

ගරු හිමියනි, ඔබ වහන්සේ නැවතත් අප දේශයේ අප අතරේම උපදීවායි පතමු!

***සෝම ස්වාමීන් වහන්සේට සසර ඉම නිවන් සුව අත්වේවා !***

ගි ය ත් නොගිය ලෙස මනසින් නිති දකිමී
එහෙත් මියුරු බණ සවනට වෙයි අහිමි
දැ ය ත් අසරණය නැති ශෝකෙන් මහිමී
ය ළි ත් ඒද පෙරමග බලමින් හිඳිමී

***එක්සත් රාජධානියේ සැදැහැවතුන්***

## ශ්‍රීලංකා රණවිරුවන්ට සෙත්පතා පින්කමක්!

රට දැය සුරකින්ට ජීවිත පරිත්‍යාග කළ, සහ දැනට ජීවිත පරිත්‍යාගයෙන් සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකාවේ සේනාංකයන්හි සියළු රණවිරුවන්ට පින් පැමිණවීමට හා සෙත් පැතීමට පුණ්‍යකර්මයක්

**මෙම දෙසැම්බර් මස 13 වෙනි සෙනසුරාසදා සවස 4 ට**

***ලන්ඩනයේ එඩ්මන්ටන් හි සමාධි භාවනා මධ්‍යස්ථානයේ දී පැවැත්වෙයි.***

සියළු දේශමාමක පින්වතුන්ට මෙයට සහභාගිවන ලෙස ආයාචනා කරමු.

**Samadhi Meditation Centre**
**1 Oxford Road, Edmonton, London N9 0LY**
**Phone - 020 8803 7194**

